ඇමුණුම - 01

| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephones | 011-2136600<br>011-2136650 | මගේ අංකය<br>எனது இல.<br>My No. | HSC/APP/07/02/2020 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2136632 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | 01/06/06/-V |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2876178 | දිනය<br>திகதி<br>Date | 2020.02. 13 |
| විද්‍යුත් තැපැල<br>மின் - அஞ்சல்<br>E-mail | info@psc.gov.lk | | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk | | |

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව**
**அரசாங்க சேவை ஆணைக்குழுவின் சுகாதார சேவைக்குழு**
**HEALTH SERVICE COMMITTEE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla.**

ලේකම්,
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය.

<u>විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම.</u>
<u>විශ්‍රාමික පරිපාලන නිලධාරී ලාලනී උපුලා වීරසේකර මිය - දේශීය වෛද්‍ය අංශය.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2020.01.24 දිනැති ලිපිය හා බැදේ.

02. එකී ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් සලකා බලන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් පහත සඳහන් නියෝගයන් ලබා දී ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

I. විශ්‍රාමික පරිපාලන නිලධාරී ලාලනී උපුලා වීරසේකර මිය කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සම්බන්ධයෙන් මගේ සමාංක හා 2020.01.31 දිනැතිව ලබා දී ඇති නියෝගය <u>එලෙසම ක්‍රියාත්මක වන බව</u> ඔබට දැන්වීමට

II. එසේම අදාළ තනතුර සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ ඒ යටතේ පැවති/පවතින ආයතනයක සේවය කර විශ්‍රාම ලබා සිටින කළමනාකරණ සේවා නිලධාරී අධි පන්තියේ නිලධාරීන්ගෙන්, අමාත්‍යාංශ වෙබ් අඩවිය ඔස්සේ දැන්වීම පළකර අයදුම්පත් කැඳවා සුදුසු නිලධාරියකු තෝරා ගැනීමට.

හෝ

මෙම තනතුරේ පුරප්පාඩුව සම්පූර්ණ වන තුරු ඒ සඳහා වැඩ බැලීමේ/රාජකාරී ඉටුකිරීමේ පදනම මත I ශ්‍රේණියේ කළමනාකරණ සේවා නිලධාරියකු පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඔබට දැන්වීමට.

එල්.ඒ. කළුකපුආරච්චි
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
සෞඛ්‍ය සේවා කමිටුව

**විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම්පත් කැඳවීම**
**දේශීය වෛද්‍ය අංශය**

දේශීය වෛද්‍ය අංශයේ පුරප්පාඩුව පවතින පරිපාලන නිලධාරී තනතුර සඳහා සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය හෝ ඒ යටතේ පැවති / පවතින ආයතනයක සේවය කර විශ්‍රාම ලබා සිටින කළමනාකරණ සේවා නිලධාරි අධි පන්තියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පහත ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පත් 2020.02.28 හෝ එදිනට පෙර ලැබෙන සේ අතිරේක ලේකම් (පාලන) , දේශීය වෛද්‍ය අංශය , සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය, අංක 26, 3 වන මහල, ශ්‍රී සංඝරාජ මාවත , කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයෙහි වමත්පස ඉහළ කෙළවරේ "පරිපාලන නිලධාරී තනතුර - දේශීය වෛද්‍ය අංශය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**විශ්‍රාමික රජයේ නිලධරයන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා අයදුම් පත්‍රය**
**පරිපාලන නිලධාරී තනතුර - දේශීය වෛද්‍ය අංශය**

01. සම්පූර්ණ නම:-

02. මුලකුරු සමඟ නම:-

03. උපන් දිනය:-

04. ජාතික හැඳුනුම්පත් අංකය:-

05. විශ්‍රාම ලැබීමට පෙර අවසන්වරට සේවය කල තනතුර,
    එම තනතුර අයත් වූ සේවාව හා ශ්‍රේණිය:-

06. සේවය කර ඇති සේවා ස්ථාන හා කාලසීමා :-

07. විශ්‍රාමගත් දිනය:-

08. විශ්‍රාම ගත් ආකාරය:-

09. විශ්‍රාම ලැබීමෙන් පසු නැවත සේවයේ යෙදී සිටියේද ? එසේ නම් සේවයේ යෙදී සිටි ආයතන :-

10. විනය පරීක්ෂණ පවතීද / පැවතියේද යන වග :-

.................................. ..............................................

දිනය අත්සන